# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

**BCOM E 3063 - බදුකරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි : (04) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

බණ්ඩාර මහතා සිල්ලර ව්‍යාපාරයක නියුතු තනි පුද්ගල ව්‍යාපාරිකයෙකි. ඔහු මෙම ව්‍යාපාරය 2014/2015 තක්සේරු වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2018/2019 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම් බදු වගකීම ගණනය කිරීම සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

1. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු. 4,800,000 කි.
2. දේපල පිරියත හා උපකරණ

රු. '000

| විස්තර | 2018.04.01ට ශේෂය | එකතුකිරීම් | (ඉවත්කිරීම) | 2019.03.31ට ශේෂය |
|---|---|---|---|---|
| පිරිවැය | | | | |
| ඉඩම් | 5,000 | - | - | 5,000 |
| ගොඩනැගිලි | 2,000 | 400 | - | 2,400 |
| මෝටර් රථ | 800 | 600 | - | 1,400 |
| කාර්යාල ලී බඩු | 200 | - | - | 200 |
| යන්ත්‍ර හා උපකරණ | 450 | 150 | - | 600 |
| | **8,450** | **1150** | - | **9,600** |
| ක්ෂය | | | | |
| ඉඩම් | - | - | - | - |
| ගොඩනැගිලි | 1000 | 200 | - | 1,200 |
| මෝටර් රථ | 800 | 150 | - | 950 |
| කාර්යාල ලී බඩු | 200 | - | - | 200 |
| යන්ත්‍ර හා උපකරණ | 450 | 30 | - | 480 |
| | **2,450** | **380** | - | **2,830** |

* වර්ෂය තුල එකතුකිරීම් හැර, අනෙකුත් සියළුම වත්කම් ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී මිලට ගත් ඒවාය.

3. ශුද්ධ ලාභය තුල ස්ථාවර තැන්පතු මත ලද රු. 90,000 ක පොලියක් ඇතුලත් වේ. මේ සඳහා බැංකුවෙන් රඳවා ගැනීමේ බදු අඩු කොට ඇති අතර, රඳවා ගැනීම් බදු සහතික ලැබී ඇත. එමෙන්ම, ව්‍යාපාරයට රු. 85,000 ක වට්ටම් ලද අතර, එය වෙනත් ආදායම් තුල සටහන් කරන ලදී.

4. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කිරමේදී පහත වියදම් අඩු කර ඇත.

| | රු. |
|---|---|
| ප්‍රචාරණ වියදම් | 45,000 |
| වැටුප්, සේ.අ.අ සහ සේ. භා. අ | 750,000 |
| කැලණිය විශ්වවිද්‍යාලයට මුදලින් කළ පරිත්‍යාග | 75,000 |
| ප්‍රාදේශිය සභාව සමග පැවැති ගැටළුවක් නිරාකරණය වෙනුවෙන් නීතිඥයින්ට ගෙවූ ගාස්තු | 50,000 |
| සිංගප්පුරුවේ පැවැති ව්‍යාපාරික සමුළුවකට සහභාගි වීමට බණ්ඩාර මහතා වෙනුවෙන් දැරූ විදේශ ගමන් ගාස්තු | 300,000 |
| අඩමාණ ණය වෙන්කිරීම් | 80,000 |
| පාරිතෝෂික වෙන්කිරීම් (සටහන) | 150,000 |
| දඩ | 30,000 |
| විනෝද වියදම් | 175,000 |

සටහන :

වසර තුල ඔහු රු. 75,000 ක පාරිතෝෂික ගෙවා ඇත.

5. පෞද්ගලික ගණුදෙනු සම්බන්ධ තොරතුරු

* බණ්ඩාර මහතා කලුතොට වී ලැයිස්තුගත සමාගමේ කොටස් වල ආයෝජනය කොට ඇති අතර, ඒ වෙනුවෙන් වසර තුල රු. 30,000 (ශුද්ධ) ලාභාංශ ලැබී ඇත.
* බණ්ඩාර මහතා ඔහුගේ එක් නිවසක් රු. 35,000 ක මාසික අගයකට කුලියට දී ඇත.
* බණ්ඩාර මහතා රු. 380,000 ක් වටිනා ලොතරැයි දිනුමක් ලබන ලදී.

2018/2019 තක්සේරු වර්ෂය සඳහා බණ්ඩාර මහතාගේ ආදායම් බදු වගකීම ඔබ විසින් ගණනය කළයුතුය.

(මුළු ලකුණු 40)

ප්‍රශ්න අංක - 02

ප්‍රනාන්දු මහතා ගෝල් ලැයිස්තුගත සමාගමේ අලෙවි කළමනාකරුය. 2018/2019 තක්සේරු වර්ෂය තුල ඔහු තම සේවා නියුක්තිය වෙනුවෙන් පහත ආදායම් /ප්‍රතිලාභ ලබා ඇත.

* මාසික වේතනය - රු. 200,000 (සමාගමේ පැවති මුදල් ගැටළුවක් හේතුවෙන් 2019 මාර්තු මස වේතනය ඔහුට ලැබී නැති අතර පසුගිය වසරේ හිඟ වැටුප් වෙනුවෙන් රු. 180,000 ක් 2018 අප්‍රේල් මාසය තුල ලැබී ඇත. )
* මාසික ගමන් දීමනා - රු.20,000
* නිවාඩු දීමනා - රු. 2500 ( දින 25 වෙනුවෙන්)
* 2018 දෙසැම්බර් මස තුල ලද ප්‍රසාද දීමනා - රු. 275,000
* දුරකථන බිල් ප්‍රතිපූර්ණය - රු. 50,000
* ඔහු සමාගමේ කර්මාන්තශාලාව තුලදී 2019 පෙබරවාරි මස අනතුරකට ලක් වූ අතර, 2019 මැයි මාසය තුලදී සමාගම විසින් ඔහුගේ රු. 250,000 ක් වූ සියලු වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය කොට ඇත.
* ඔහු සමාගම විසින් ලබා දී ඇති වරිපනම් ප්‍රදේශයක පිහිටි නිවසක ජීවත් වේ. එම නිවස ගෘහභාණ්ඩ සහිතව ලබා දී ඇත.
* ඔහුට තම පෞද්ගලික හා රාජකාරි ගමන් වෙනුවෙන් මෝටර් රථයක් ලබා දී ඇත. එහි එන්ජින් ධාරිතාව 1300 ක් වන අතර සමාගම විසින් මෙහි නඩත්තු කටයුතු කරනු ලබයි. ගෝල් සමාගම විසින් මෙම මෝටර් රථය භාවිතය සම්බන්ධව නිවැරදි වාර්තා තබාගෙන ඇත. වසර තුල ප්‍රනාන්දු මහතා කි.මී. 18,000 ක් මෙම වාහනයෙන් ගමන් කොට ඇත.
* වසර තුල ප්‍රනාන්දු මහතා තම පවුලේ සාමාජිකයන් සමඟ සති දෙකක කාලයක් සඳහා සිංගප්පූරුවට ගොස් ඇත. එමෙන්ම, ඔහු සමාගමේ අලෙවි අධ්‍යක්ෂ සමග සමුළුවක් සඳහා වියට්නාමයට ද ගොස් ඇත. පිළිවෙලින් රු. 150,000 ක් හා රු. 200,000 ක් වූ ඔහුගේ විදේශ ප්‍රවේශ පත්‍ර ගාස්තු සමාගම විසින් දරා ඇත.

2018/2019 තක්සේරු වර්ෂය සඳහා ප්‍රනාන්දු මහතාගේ සේවා නියුක්ත ආදායම ගණනය කරන්න.

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

අ. තනි පුද්ගලයෙකුගේ ආයෝජන ආදායම, ව්‍යාපාර ආදායමෙන් උදාහරණ සහිතව වෙන් කොට දක්වන්න.

(ලකුණු 08)

ආ. පහත තොරතුරු 2018/2019 තක්සේරු වර්ෂය සඳහා රණබාහු මහතාට අදාල වේ.

1. 2016.12.15 දින රණබාහු මහතා රු. 6,500,000 කට ඉඩමක් හා ගොඩනැගිල්ලක් මිලට ගත් අතර එය තම ආයෝජනයක් ලෙස තබා ගන්නා ලදී. 2017.09.30 දිනට මෙම ඉඩම හා ගොඩනැගිල්ලේ වටිනාකම රු. 7,200,000 ක් විය. 2018.07.01 දින රණබාහු මහතා විසින් මෙම ඉඩම හා ගොඩනැගිල්ල රු. 8,000,000 කට විකුණන ලද අතර එහිදී රු. 80,000 ක ප්‍රචාරණ වියදමක් ද, විකුණුම් මිලෙන් 5%ක තැරැව්කාර ගාස්තුවක් ද දරණ ලදී.
2. රණබාහු මහතා රු. 1,300,000 කට කොළඹ කොටස් වෙළඳපලෙහි ලැයිස්තුගත සමාගමකින් කොටස් මිලට ගන්නා ලදී. 2018.10.01 දින ඔහු මෙම කොටස් රු. 1,430,000 කට විකුණන ලදී. එදිනම, රු. 4,000,000 ක වටිනාකමකට පුද්ගලික සමාගමක කොටස් වල ඔහුට තිබූ ආයෝජනය රු. 5,000,000 කට විකුණන ලදී.
3. 2018 සැප්තැම්බර් 20 දින ඔහු තම මහල් නිවාසය රු. මිලියන 7 කට විකුණන ලදී. ඔහුට මෙම නිවස ලැබුනේ 2017.12.05 දින සිදු වූ ඔහුගේ පියාගේ මරණය හේතුවෙනි. පියා විසින් මෙම මහල් නිවාසය රු. මිලියන 3.5 කට 2017.10.30 දින මිලට ගෙන ඇති අතර ඔහු මියයන විට එහි වෙළඳපල වටිනාකම රු. මිලියන 4 ක් විය.
4. 2018.07.15 දින රණබාහු මහතා තම නිවසේ අයිතිය තම බිරිඳට පවරන ලදී. ඔහු මෙම නිවස මීට වසර දෙකකට පෙර මිලට ගෙන ඇති අතර, මේ දක්වාම එහි වාසය කොට ඇත. මිලදී ගත් අගය රු. 3,000,000 ක් වන අතර ඔහු තවත් රු 1,000,000 ක් සංවර්ධන කටයුතු සඳහා දරා ඇත. පවරන අවස්ථාවේදී වෙළඳපල අගය රු. 5,500,000 කි.

ඉහත ගණුදෙනු වලට අදාලව පැන නගින බදු වගකීම් පිළිබඳව ඔබ විසින් රණබාහු මහතාට උපදෙස් ලබා දිය යුතුය.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

ආදායම් බදු සම්බන්ධව පහත පද නිර්වචනය කරන්න.

අ. නේවාසික තනිපුද්ගලයා

ආ. පුද්ගලයා

ඇ. අනුක්‍රමණ මූලධර්මය

ඉ. ස්වයං තක්සේරුව

(මුළු ලකුණු 20)